00280

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ**
**ඩිප්ලෝමා පාඨමාලාව ( 3 වන මට්ටම)**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESD 1134 – සෞඛ්‍යය පෝෂණය සහ ආරක්ෂණය පිළිබඳ ගත යුතු පියවර**

**කාලය - පැය 02යි.**

---

**දිනය - 2014.11.23** **වේලාව - පෙ.ව. 10.00 - මධ්‍යා.12.00**

---

**'I' කොටසේ <u>සියළුම</u> ප්‍රශ්නවලටද 'II' කොටසේ තෝරාගත් ප්‍රශ්න <u>තුනකට ද</u> පිළිතුරු සපයන්න.**

<u>I කොටස</u>

01. බෝවන රෝගයක් වැළඳුන රෝගියෙකු අන් අයගෙන් වෙන් කොට සාත්තු කිරීමෙන් රෝගය පැතිරී යාම අවම කර ගත හැක. එසේ රෝගියෙකු වෙන්කොට සාත්තු කිරීමේදී ඔබ අනුගමනය කළ යුතු වැදගත් පියවර **පහක් (05)** නම් කරන්න.

02. (i) එළවලු පමණක් ආහාරයට ගන්නා ගැබිණි මවකට තම ප්‍රෝටීන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පහසුවෙන් සපයා ගත හැකි ආහාර **තුනක් (03)** නම් කරන්න.

    (ii) ගර්භණී සමයේ දී අවශ්‍යය ප්‍රමාණයන්ගෙන් ප්‍රෝටීන ලබා ගැනීමෙන් ලැබෙන වාසි **දෙකක් (02)** දක්වන්න.

03. කුඩා දරුවන් සඳහා බොජුන්පත් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු සාධක **දෙකක් (02)** සාකච්ඡා කරන්න.

04. උපතේ සිට මුල් මාස 4 -6 අතර කාලය ළදරුවෙකුට අතිරේක ආහාර ලබාදීමට සුදුසුම වයස් සීමාව වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

05. කුඩා දරුවන් අතරේ බහුල රෝගී තත්ත්වයන් වන පණු ආසාදන ඔවුන්ගේ සෞඛ්‍යයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. බෝවන ගුන්ථි ආශ්‍රිතව වැළඳෙන සංක්‍රාමණික රෝගී තත්ත්වය නම් කර එහි රෝග ලක්ෂණ දක්වන්න.

07. වෙළඳපොළෙහි ඇති පැණි රසබීම, වර්ණවත් කෑම වර්ග, පැණි රස කෑම වැඩි වශයෙන් ආහාරයට ගැනීම දරුවන්ගේ සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කරයි.

(i) ඉහත වගන්තිය සනාථ කිරීමට කරුණු දෙකක් (02) ක් දක්වන්න.

(ii) එවැනි ආහාරවලට දරුවන් තුළ ඇති කැමැත්ත අවම කිරීමට ඔවුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා පාසලකට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් (03) ක් සඳහන් කරන්න.

08. රට තුළ ව්‍යාප්ත වන ඩෙංගු රෝගය වැළැක්වීමට රජය විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇතත්, එම රෝගය වරින් වර රටතුළ උග්‍රවීමට හා ඉක්මනින් පැතිර යාම සඳහා හේතු මොනවා ද?

(ලකුණු 5 x8 = 40)

## II වන කොටස

09. (i) නිවස තුළදී දරුවන්ට සිදුවිය හැකි තෙත් තාප පිළිස්සීම් හා වියළි තාප පිළිස්සීම් සඳහා උදාහරණ **දෙක (02)** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) තාප පිළිස්සීමක දී රෝගියා රෝහල් ගත කිරීමට පෙර අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග හතරක් (04) ක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ඔබ ඉහත සඳහන් කළ එක් එක් ක්‍රියාමාර්ගයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iv) බොහෝ පිළිස්සීම් වළක්වා ගත හැකි ඒවාය. මේ සඳහා කුඩා දරුවන් සිටින වැඩිහිටියන් විසින් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙල විස්තර කරන්න. (ලකුණු 04)

(ලකුණු 20)

10. රිය අනතුරකින් පසු රෝගියකු තුළ ඇතිවිය හැකි පිටගැස්ම තත්ත්වය වළක්වා ගැනීමට පිටගැස්ම ප්‍රතිමස්තු ලබා දෙනු ලැබේ.

(i) ඉහත අවස්ථාවේදී රෝගියාට ලබා දෙනු ලබන ප්‍රතිශක්ති ආකාරය නම් කර එහි ඇති වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 04)

(ii) එන්නත් උණුසුමින් හා ආලෝකයට නිරාවරණය වීමෙන් ආරක්ෂා කරගත යුතුයි. මේ සඳහා භාවිතා කරන "ශීත දාමය" නම් ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) දරුවෙකු යම් රෝගී තත්ත්වයකට පත් වූ පසු ඔහුගේ/ඇයගේ ශරීර උෂ්ණත්වය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළයාම උණ නැතහොත් ජ්වරය ලෙස හඳුන්වයි.

(අ) උණ රෝගයෙහි රෝගී ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) දරුවකු උණ රෝගයෙන් පෙළෙනවිට දෙමාපියන් අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග විස්තර කරන්න. (ලකුණු 04)

(iv) ඔබ ඩෙංගු රක්තපාත උණ, සාමාන්‍ය උණ රෝගයෙන් වෙන් කොට හඳුනා ගන්නේ කෙසේ ද? (ලකුණු 05)

(ලකුණු 20)

11. ගර්භනී මාතාවක් පෝෂ්‍ය පදාර්ථ සියල්ලම ඇතුලත් සමබල ආහාර වේල් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

(i) ගර්භනී මව්වරුන් සඳහා ආහාර පිළියෙල කිරීමේ දී හැමවිටම අයඩින් මිශ්‍ර ලුණු භාවිතා කිරීමේ වැදගත්කම පහදන්න. (ලකුණු 06)

(ii) නීරෝගී දරුවෙකු බිහි කිරීම සඳහා පෝෂ්‍යදායි ආහාර ගැනීමට අමතරව ගර්භනී මවක් විසින් අනුගමනය කළයුතු වෙනත් ක්‍රියාමාර්ග **හතරක් (04)**ක් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(iii) පළමු මාස හතර තුළදී ළදරුවෙකුට මව් කිරි පමණක් ලබා දිය යුතුයි. නමුත් විවිධ හේතූන් නිසා ඇතැම් ළදරුවන්ට ළදරු කිරි පිටි ලබාදෙන අවස්ථාවන් ද ඇත. මෙසේ ළදරුවෙකුට කිරිපිටි දීමේදී ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ලකුණු 20)

12. (i) දුෂ්පෝෂණය යනු කුමක් ද? (ලකුණු 04)

(ii) (අ) ක්වොෂියොකෝර් රෝගී තත්ත්වය ඇතිවීමට හේතුව කුමක් ද? (ලකුණු 02)

(ආ) ක්වොෂියොකෝර් රෝගයේ රෝගී ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 04)

(iii) යකඩ ඌනතාවයෙන් පෙළෙන දරුවෙකුට ලබාදිය යුතු ආහාර මොනවාද? (ලකුණු 04)

(iv) "දෙමාපියන්ගේ අධික කාර්ය බහුල ජීවන රටාව දරුවන් තුළ විවිධ දුෂ්පෝෂණ තත්ත්වයන් ඇති කිරීමට බලපාන එක් කරුණකි."

ඉහත ප්‍රකාශය විභාග කරන්න. (ලකුණු 06)

(ලකුණු 20)

12. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක් (02)** සඳහා කෙටි සටහන් ලියන්න.

(i) පාචනය වළක්වන්නේ කෙසේ ද?

(ii) දරුවෙකුගේ මානසික සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන සාධක

(iii) ප්‍රථමාධාරකරුවෙකුගේ වගකීම්

(iv) දරුවන්ට ආහාර පිළිගැන්වීමේදී දෙමාපියන් විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

002

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2014**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 3**

**ESD1134 – CURRICULUM STUDIES AND PRACTICUM – HEALTH NUTRITION AND SAFETY MEASURES**

**DURATION – TWO (02) HOURS.**

---

Date: 23.11.2014 Time: 10.00 a.m.- 12.00 noon

---

Answer all questions in Part I and any three from Part II.

## PART I

01. When treating a patient with transmitted diseases, that patient should be isolated to minimize the spreading of the disease. Name **five (05)** important steps that you have to follow when isolating a patient.

02. i. Name **three (03)** easily available food items that can fulfill the protein needs of a vegetarian pregnant woman.

    ii. State **two (02)** advantages of taking sufficient amount of proteins during the pregnant period.

03. Discuss **two (02)** factors that should be considered when planning a menu for small children.

04. Explain why the age period of birth to 4 – 6 months, is the most suitable age limit to introduce additional foods to an infant.

05. Explain briefly the way the warm infections (very common disease among young children) affect the health of young children.

06. Name the communicable disease condition that infects salivary glands and state the symptoms of it.

07. Taking excessive amount of sweet drinks coloured food items, sweet foods that are sold in the market cause bad effects to the health of children.

i. State **two (02)** facts to justify above statement.

ii. Mention **three (03)** strategies that can be adopted by the school to effect attitudinal change in children to minimize their interest in such foods.

08. Although the government has taken several steps to prevent Dengue disease, what are the reasons for spreading of the disease severely and quickly within the country from time to time?

(5 x 8 = 40 marks)

## PART II

09. i. Mention **two (02)** examples for wet thermal burns and **two (02)** examples for dry thermal burns that may happen to children within the home.

(04 marks)

ii. Explain **four (04)** strategies that should be followed in a thermal burn before admitting the patient to the hospital.

(04 marks)

iii. Discuss the importance of each strategy that you mentioned above.

(08 marks)

iv. Most of burns can be avoided. Describe the procedure that should be followed by the adults who have small children to avoid burns.

(04 marks)

(20 marks)

10. After an accident anti-tetanus serum is given to prevent the tetanus condition that may occur in a patient.

i. Name the type of immunity that is given to the patient in above instance and describe the importance of it.

(04 marks)

ii. Vaccines should be protected from exposing to the heat and light. Briefly describe the procedure named as the 'cold chain' that is used for this?

(03 marks)

iii. A sustained body temperature of a child above the normal level after he/she is subjected to a disease condition is known as fever.

a. Explain the features of fever.

(04 marks)

b. Describe the strategies that should be followed by the parents when a child is suffering from fever.

(04 marks)

iv. How do you differentiate the dengue fever from a normal fever?

(05 marks)

(20 marks)

11. It is essential for a pregnant mother take balanced meals with all the nutrients.

i. Explain the importance of using iodized salts, when preparing food for pregnant mother.

(06 marks)

ii. Discuss **four (04)** strategies that should in addition to follow by a pregnant mother to taking nutritious food to give a birth of a healthy child.

(08 marks)

iii. Only the breast milk should be given to an infant during the first four month. But there are some instances that formula milk is given to some infants due to various reasons. Explain the risk conditions that may occur when giving formula milk to an infant.

(06 marks)

(20 marks)

12. i. What is Malnutrition?

(04 marks)

ii. a. What is the reason for Kwoshiorkor disease?

(02 marks)

b. Describe the features of the Kwoshiorkor disease.

(04 marks)

iii. What are the foods that should be given to a child suffering from iron deficiency?

(04 marks)

iv. Busy life style of parents is one reason that affect various malnutrition conditions in children.

Examine the above statement.

(06 marks)

(20 marks)

13. Write short notes on any two of the followings.

a. How to prevent diarrhea?

b. Essential factors for the improvement of the mental health of a child.

c. Responsibilities of the First Aider.

d. Strategies that should be followed by the parents when serving food to children.

(10 x 2 = 20 marks)

*-Copyrights reserved-*